# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2010
2011 අප්‍රේල් / මැයි

## මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ සංස්කෘතිය - BUCU. E 1015

### භාරතීය සංස්කෘතික පසුබිම හා බෞද්ධ සංස්කෘතියේ මූලධර්ම

<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි | කාලය : පැය 03 යි

---

01. "සොබා දහමෙහි අපූර්ව ක්‍රියාකාරිත්වයත්, සුන්දරත්වයත්, දුටු වෛදිකයෝ එය දේවත්වයට නැගූහ." නිදසුන් සහිතව විමසන්න.

02. බ්‍රාහ්මණ වර්ණ ධර්ම හා ස්වධර්ම න්‍යාය තත්කාලීන ශ්‍රමික ප්‍රජාව කෙරෙහි ඇතිකළ අහිතකර බලපෑම සකාරණව පැහැදිලි කරන්න.

03. වෛදික යාග විධි, ඒවායෙහි අරමුණු හා කාර්ය සංසිද්ධියද පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් කරන්න.

04. අමරාවික්ඛෙපවාදය හඳුන්වා දෙමින්, සංජය බෙල්ලට්ඨිපුත්ත එම වාදයට වැටෙනුයේ කවර කරුනු අනුවදැයි විභාග කරන්න.

05. යෝග භාවනාවන් අරබයා බුද්ධකාලීන අබෞද්ධ ශ්‍රමණ කොටස් අතර පැවති අවදිකම විචාරපූර්වකව සාකච්ඡා කරන්න.

06. චිත්ත සමාධිය ධර්මානුකූලව පැහැදිලි කරමින් එය මෙලොව ජීවිතයේ අභිවෘද්ධියට ද අදාලවන අන්දම සනිදර්ශනව පරීක්ෂා කරන්න.

07. සිතීමට හා විමැසීමට බුදුදහමින් ලැබෙන නිදහස සමකාලීන සාමයික තත්වයන්ට සාපේක්ෂව ඇගයුමට ලක් කරන්න.

08. බුදුදහම තුළ පුදසිරිත් පිළිබඳව කෙබඳු ආකල්පයක් දක්නා ලැබේද? විමසන්න.

09. කාමසුඛල්ලිකානුයෝගය හඳුන්වා දෙමින් ඒ පිළිබඳ බෞද්ධ ආකල්පය කුමක්දැයි පරීක්ෂා කරන්න.

10. පහත දක්වෙන මාතෘකාවලින් <u>දෙකකට</u> ප්‍රමාණවත් විවරණ සපයන්න.

    1. නියතිවාදය
    2. ආත්ම සංකල්පය
    3. ශීල ශික්ෂාවෙහි ආනිසංස
    4. බුදුන් වදාළ ප්‍රඥාව